5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව අනුමාන පෙරහුරු පරීක්ෂණය

1-1

# දකුණ පළාත

EXAMINATIONS FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES

පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

විභාග අංකය : ..............................


## I පත්‍රය


පැය එකයි.

---


- අංක 01 හා 02 ප්‍රශ්නවල මුල් රූපයට සමාන රූපය තෝරන්න.

01.






(1)





(2)




(3)

02.






(1)



(2)



(3)

- පහත දැක්වෙන කවිය ඇසුරින් අංක 03 සහ 04 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.

[ 1 ] ගස් දෙක යට
ගිනි [ ] පස් දෙන යි
උන්ට [ 2 ] දෙන විට
උනුත් එක්ක [ ]


03. මෙම කවියේ අංක 1 හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.

1. රන් රඹුටන් කුකුළන්
2. රන් රඹුටන් ගිනි කුකුළන්
3. රන් පාටට කිකිළියෝ

04. මෙම කවියේ අංක 2 හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.

1. කන්න බත් හරි හැඩයි
2. කන්න බත් ලස්සන යි
3. කන්න වී ලස්සන යි


05. සතුන්, ක්ෂීරපායින්, මුවා දැක්වීමට මෙම රූපය ඇඳ තිබේ. මෙහි C අක්ෂරයෙන් පෙන්නුම් කරන්නේ මොනවා ද?




1. සතුන්
2. ක්ෂීරපායින්
3. මුවා

- ප්‍රශ්න අංක 06 සහ 07 සඳහා දී ඇති රූප අතරින් ඉතා ම කිට්ටු සම්බන්ධතාවක් ඇති රූප යුගලය දැක්වෙන පිළිතුරු තෝරන්න.


06.



| A | B | C | D | E | F |
|---|---|---|---|---|---|

1. A සහ B  2. D සහ F  3. A සහ E

07.



| A | B | C | D | E | F |
|---|---|---|---|---|---|

1. B සහ D  2. F සහ B  3. A සහ E

08. "අතිරසත් තිත්ත වීම" යන යෙදුම පැහැදිලි කරන ප්‍රකාශය,

1. ප්‍රමාණය ඉක්මවා යාමෙන් නරක ප්‍රතිඵල ලැබේ.
2. රස බැලීමට වැඩියෙන් කෑ යුතු වේ.
3. ඉතා පැණි රස වූ විට තිත්ත ගතියක් දැනේ.

- පහත දැක්වෙන කවිය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.

පාට පාට මැණික් ජාති
පසට යටින් කැටි වේ
රත්නදීප පොළොව තුළින්
ධන නිධාන මතු වේ




09. මෙම කවිය තුළින් විස්තර කෙරෙන්නේ,

1. මගේ රට ගැන
2. මැණික් පිළිබඳ
3. මහපොළොව ගැන

10. භූමිය යන අදහස දෙන පදය වන්නේ,



1. මැණික්
2. පොළොව
3. රත්නදීප

11. නිපුන් බස්නාහිර සිට නැගෙනහිර දෙසට මඳ දුරක් ගොස් ඉන් පසු දකුණු දෙසට හැරී ගොස් ඊසාන දෙසට ගමන් කළේ ය. එම ගමන් මාර්ගය දැක්වෙන නිවැරදි රූපය තොරන්න.

1. 
2. 
3. 

12. පහත රූපයේ දැක්වෙන සේ දෙකෙළවර එකට එකතු වන පරිදි කම්බියක් සලකුණු කළ තැන්වලින් නැමූ විට ලැබෙන හැඩය සහිත රූපය තෝරන්න.



1. 
2. 
3. 

13. සිසුන් හතර දෙනෙකුගේ උපන්දින මෙහි දැක්වේ. පිළිවෙළින් බාලයා සහ වැඩිමලා වන්නේ,

| | | | |
|---|---|---|---|
| චමරි | - 2006.04.30 | 1. | මයුමි, චමරි |
| මයුමි | - 2005.02.14 | 2. | පසිනි, චමරි |
| නුවනි | - 2006.09.03 | 3. | නුවනි, මයුමි |
| පසිනි | - 2005.10.27 | | |

14. මුහුද ඇසුරෙන් අපට නොලැබෙන දෙයක් සහිත පිළිතුර තෝරන්න.

1. ලුණු
2. බිත්තර
3. මාළු

15. වෙළෙන්දෙක් කිරි ලීටරයකට වතුර මිලිලීටර 100 ක් මිශ්‍ර කර ලීටරයක් රු. 120.00 කට අලෙවි කරයි. වතුර ලීටරයක් කිරි සමඟ මිශ්‍ර කර විකිණීමෙන් ඔහු උපයන මුදල කොපමණ ද?

1. රු. 1320.00  2. රු. 1200.00  3. රු. 1220.00

16.

| | | |
|---|---|---|
| පෑන් 5 + පැන්සල් 3 | = | රුපියල් 126.00 |
| පෑන් 4 + පැන්සල් 2 | = | රුපියල් 96.00 |

ඉහත සටහනට අනුව පෑනක හා පැන්සලක මිල කීයද?

1. රුපියල් 30.00  2. රුපියල් 26.00  3. රුපියල් 35.00

17. මනීෂා ළඟ රුපියල් 5 කාසි හා 2 කාසිවලින් රුපියල් 23 ක් ඇත. ඇය ළඟ ඇති 5 කාසි ගණන වන්නේ,

1. 3 කි.
2. 4 කි.
3. 2 කි.

18. එක්තරා ගොවිපළක සිටින තාරාවන් හා එළුවන් ගණන 20 කි. ඔවුන්ගේ කකුල් සංඛ්‍යාවල එකතුව 56 කි. ගොවිපළේ සිටින කුකුළන් ගණන කීයද?

1. 8 කි.
2. 14 කි.
3. 12 කි.

- **මුල් වචන දෙකේ සම්බන්ධය තේරුම් ගෙන ඊළඟ වචනයට ගැළපෙන පිළිතුරු තෝරන්න.**

19. කරණවෑමියාට දැලිපිහිය නම්, ගොවියාට


1. උදැල්ල    2. වී    3. කුඹුර

20. මුවාට පොළොව නම් උකුස්සාට

1. මස්    2. ගුවන    3. තියුණු ඇස්


- **පහත දැක්වෙන සංඛ්‍යා රටාවල හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව තෝරන්න.**

21.




1. 50    2. 54    3. 59

22.





1. 25    2. 30    3. 60

- පහත දී ඇති යෙදුම් වෙනත් අයුරකින් කියවෙන ප්‍රකාශය තෝරන්න.

23. ඉහේ මලක් පිපුණා -

1. ඉතා ලස්සන දෙයක් දැකීම.
2. ගසක අලංකාර මලක් පිපී තිබීම.
3. අධික සතුටක පත් වීම.


24. අහසේ මාලිගා තැනීම -
1. කරදකාරී ස්ථානයක්
2. ඉටු නොවන හීන මැවීම.
3. අනවශ්‍ය ලෙස වර්ණනා කිරීම.


25. 

මෙම සම්පූර්ණ රූපය අඳුරු කර ඇති කොටස මෙන් කී ගුණයක් ද?
1. දෙගුණයක් වේ.
2. තුන්ගුණයක් වේ.
3. හතර ගුණයක් වේ.

26. මේ අතරින් වැඩිම සමමිතික අක්ෂ ගණනක් ඇති රූපය තෝරන්න.


1. 

2. 

3. 

27. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. 976 + 887 - 432 = 1231
2. 798 + 687 - 967 = 518
3. 569 + 777 - 199 = 1047

28. කොඩි වැලක නිල්, කහ, රතු යන පිළිවෙළින් කොඩි එල්ලා ඇත. එහි 15 වන කොඩිය සහ 23 වන කොඩිය කුමන පාට විය හැකි ද?
1. රතු, කහ
2. නිල්, රතු
3. රතු, රතු

29. 


රූපයේ ඇති මුළු ත්‍රිකෝණ ගණන කීයද?
1. 12
2. 11
3. 10

30. 40 සිට 54 දක්වා ගණිත සංඛ්‍යා ලියූ විට 4 ඉලක්කම කී වාරයක් යෙදී තිබේ ද?
1. 11 2. 12 3. 13

31. සවස මා නිවස බලා යන විට මාගේ සෙවණැල්ල මා ඉදිරියෙන් ගමන් කළේ නම්, මා ගමන් කළේ කුමන දිශාවට ද?
1. නැගෙනහිර දිශාව
2. බටහිර දිශාව
3. දකුණු දිශාව

32. සම්බන්ධතාවය හොඳින් ම පෙන්වන වචන ඇතුළත් කොටුව තෝරා යටින් ඉරක් අඳින්න.

1. 2. 3.

- 

කුඩා ඝනක හැඩැති කැට කීපයක් යොදා ගෙන පහත නිර්මාණය සිදු කර ඇත.




33. මෙහි ඇති කුඩා කැට ගණන කීයද?

1. 8 කි.
2. 9 කි.
3. 10 කි.

34. මෙම කුඩා කැට මෙලෙසම තිබියදී ඝනකයක හැඩයක් නිර්මාණය වීමට තවත් කුඩා කැට කීයක් අවශ්‍ය ද?

1. 16 කි.
2. 17 කි.
3. 18 කි.

35. ඉහත කුඩා කැට දෙස ඉහළින් බලන විට පෙනෙන හැඩය වන්නේ කුමක් ද?

1. 
2. 
3. 

36. එක්තරා මාසයක 10 වැනි දිනය ඉරිදා දිනයකි. එම මාසයේ ම 20 වන දිනය කවදා ද?

1. සිකුරාදා
2. බදාදා
3. ඉරිදා


37. ඔරලෝසුවක පැය කටුවත් මිනිත්තු කටුවත් සෘජුකෝණයට වඩා කුඩා කෝණයක් පෙන්වන වේලාව ඇතුළත් පිළිතුර තෝරන්න.

1. 9.00
2. 2.30
3. 3.30


38. නිවැරදි අදහසක් ඇති වැකිය තෝරන්න.

1. ඝනකය මුහුණත් 6 ක් ශීර්ෂ 8 ක් හා දාර 10 ක් ඇති ඝන වස්තුවකි.
2. ඝනකාභය මුහුණත් 6 ක් ශීර්ෂ 8 ක් හා දාර 12 ක් ඇති ඝන වස්තුවකි.
3. ගෝලය වක්‍ර පෘෂ්ඨයක් හා වක්‍ර දාරයක් සහිත ඝන වස්තුවකි.

39. මෙම ඝන වස්තුවේ ඇති දාර, ශීර්ෂ සහ මුහුණත් සංඛ්‍යාවේ එකතුව කීයද?



1. 18
2. 19
3. 20

40. 

මෙම රූපයෙන් 0.4 ක් පෙන්වීමට කොටු කීයක් අඳුරු කළ යුතු ද?

1. 5
2. 7
3. 4

(ලකුණු 2 1/2 × 40 = 100)

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව අනුමාන පෙරහුරු පරීක්ෂණය

1-2

# දකුණු පළාත

EXAMINATIONS FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES

පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

විභාග අංකය : ..............................

## II පත්‍රය

පැය එකයි මිනිත්තු 15

- පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

මුදු වෙරළේ සෙල්ලම් කිරීමට ළමයි ඉතා ආශා ඇත්තෝ ය. සමහර ළමයි රළ පාගමින් වෙරළේ ඔබ මොබ දුවති. වෙරළට ළංව බිඳ වැටෙන රළයක් වේගයෙන් ගොඩට දිවෙයි. රළ පාගමින් සිටින ළමයි ද රළයට අසු වී ඇඳුම් තෙමෙතැයි බියෙන් වහ වහා වෙරළට දුවති. රළය බිඳ වැටීමෙන් ගලන වතුරෙන් කොටසක්, තීන්ත පොවන කඩදාසියක් තීන්ත උරාගන්නාක් මෙන්, බුරුල් පස අතරින් පොළොව උරා ගනියි. ඉතුරු වන වතුර වහා වහා ආපහු මුදට ම ඇදී යයි.

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු ඉහත ඡේදයෙන් ම තෝරා ලියන්න.

   i. මුහුදු වෙරළේ සෙල්ලම් කිරීමට ආශා කළේ කවුද? ..............................

   ii. ඡේදයේ සඳහන් ප්‍රාණවාචී බහුවචන උක්ත පදය තෝරා ලියන්න. ..............................

   iii. ළමයින් වහ වහා වෙරළට දිවුවේ ඇයි? ..............................

   iv. 'ජලය' යන්නට සමාන පදයක් ඡේදයෙන් සොයා ලියන්න. ..............................

   v. ඉතිරි වන ජලය ආපසු ගියේ කොහාට ද? ..............................

   vi. මෙහි දැක්වෙන උපමාව තෝරා ලියන්න. ..............................

(ලකුණු 6)

2. පහත දැක්වෙන්නේ පෞද්ගලික ලිපියක ආකෘතියකි. එහි පළමු හා දෙවන හිස්තැනට ආ යුත්තේ කුමක් දැයි හිස්තැන මත ලියන්න.

..............................

..............................

01. ..............................

02. ..............................

..............................

(ලකුණු 2)

3. පහත වචන ගළපා වැකියක් ලියන්න.

වඩා/ ඔරුව/ හොඳ/ නැවැත්වූයේ/ තැනක ය.

.............................................................................................................................................................

(ලකුණු 1)

4. පහත සඳහන් එක් එක් වැකියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

i. පොල් ගෙඩිය බිම වැටී තිබුණේ ය. ( )

ii. ඈ අපට කවි පන්තියක් කියා දුන්නෝ ය. ( )

iii. මම අම්මාට උදව් කළෙමි. ( )

iv. ඒවා විවිධ වර්ණවලින් යුක්ත වූවේ ය. ( ) (ලකුණු 4)

5. සුදුසු විරාම ලකුණු යොදන්න.

ඔයාලා කැමති එහෙම ද මුල් ගුරුතුමා විමසුවේ ය (ලකුණු 1)

6. i. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු වචනය හිස්තැනෙහි ලියන්න.

කට නිසා ............................................ නැහුණා වගේ

ii. පහත ආප්තෝපදේශයෙහි අදහස ලියන්න.

ඇවිළෙන ගින්නට පිදුරු නොදමන්න.

.............................................................................................................................................................

(ලකුණු 2)

7. පහත වචනවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i. ඇල, උපකරන, ගවේෂණය, පළතුරු

ii. සෙවනැල්ල, ලේඛනය, කොල, තීරනය

(ලකුණු 2)

8. ස්ත්‍රී ලිංග පදය ලියන්න.

සිංහයා - .................................. (ලකුණු 1)

9. පහත තේරවිල්ල තෝරන්න.

උස ම උසයි - බෙල්ල දිගයි

ගස්වල දලු - හිටගෙන කයි .................................. (ලකුණු 1)

10. පහත වැකි ලිඛිත බසට හරවන්න.

i. අක්කා වැස්සේ ම පාසලට ගියා.

..........................................................................................................................................

ii. ලේඛකයා කෙටි කතා පොතක් ලිවුවා.

..........................................................................................................................................


(ලකුණු 2)

11. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය බැගින් ලියන්න.


i. Fingers - ........................................ ii. Cakes - ........................................

(ලකුණු 2)

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

i. 


..............................

ii. 

..............................

(ලකුණු 2)

13. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i. likes/ It/ milk - ..........................................................................................

ii. do/ live/ where/ you- ..........................................................................................

(ලකුණු 2)

14. 'කෛ' යන දෙමළ වචනයේ තේරුම ලියන්න. ..........................................................................................

(ලකුණු 1)

15. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

මුහුණ සෝදන්න - ..........................................................................................

(ලකුණු 1)

16. පහත රවුම තුළ ඇති ඉලක්කම් සියල්ල යොදා ගෙන සෑදිය හැකි විශාලම සංඛ්‍යාව අග සිට මුලට ලියූ විට ලැබෙන සංඛ්‍යාවේ සංඛ්‍යා නාම ලියන්න.

(2, 5, 3, 7, 1)

..................................................

17. පහත සංඛ්‍යා අවරෝහණ පටිපාටියට සකස් කර ලියන්න.

3536, 1230, 4560, 5970, 6735 - ..........................................................................................

18. යහළුවන් සිව්දෙනෙකු විසින් එකතු කරන ලද මුද්දර සංඛ්‍යාව පිළිවෙළින් 5322, 1270, 840, 25 ක් වේ. ඔවුන් සිව්දෙනාම එකතු කරන ලද මුළු මුද්දර සංඛ්‍යාව කීයද?

..........................................

- පහත වගුව ඇසුරෙන් ප්‍රශ්න අංක 19 සහ 20 සඳහා පිළිතුරු සපයන්න.

| දවස | විකිණූ පත්තර ගණන |
|---|---|
| සඳුදා | 6762 |
| අඟහරුවාදා | 3650 |
| බදාදා | 2238 |
| බ්‍රහස්පතින්දා | 5280 |

19. බදාදාට වඩා සඳුදා විකිණූ මුළු පත්තර ගණන කොපමණ ද? ..........................................

20. එක් පත්තරයකින් රුපියල් 5.00 ක ලාභයක් ලැබෙන්නේ නම් අඟහරුවාදා දින පත්තර විකිණීමෙන් ලැබෙන ලාභය කොපමණ ද?

..........................................

21. දොඩම් ගෙඩි 840 කින් 3/4 ක් විකිණූ පසු, ඉතිරි දොඩම් ගෙඩි සංඛ්‍යාව කොපමණ ද? ..........................................

22. i. චාරිකාවක් යාම සඳහා එක් අයෙකුගෙන් රු. 420/- බැගින් 38 දෙනෙකුගෙන් මුදල් එකතු කරන ලදි. එකතු කළ මුළු මුදල කීයද?

..........................................

ii. එම මුදලින් 2/4 ක් බස් රථය සඳහා ගෙවීමට සිදු විය. බස් රථයට ගෙවූ මුදල කීයද?

..........................................

23. කිරිබත් පිසීම සඳහා කැකුළු සහල් 3kg 500g ක් අවශ්‍ය වේ. නිවසේ දැනට ඇත්තේ කැකුළු සහල් 750g ක් පමණි. කිරිබත් පිසීම සඳහා තව කොපමණ සහල් රැගෙන ආ යුතු ද?

..........................................


24. i. ගස්ලබු ගෙඩි 10 කින් බීම වීදුරු 70 ක් සෑදිය හැකි නම්, බීම වීදුරු 700 ක් සෑදීමට අවශ්‍ය ගස්ලබු ගෙඩි ගණන කීයද? ..........................................

ii. වීදුරුවකට අල්ලන බීම ප්‍රමාණය 300ml නම්, ගස්ලබු ගෙඩි 10 කින් සෑදිය හැකි බීම ප්‍රමාණය ලීටර කීයද? ..........................................

25. පෙර හා පසු රෝම සංඛ්‍යා හිස්තැනෙහි ලියන්න.

.................. ix ..................

26. රුපියල් 1200 ක් වැය කර මිල දී ගත් එළවළු පිළිබඳ ප්‍රස්තාරයේ දැක්වේ. ලීක්ස් සහ කැරට් මිලදී ගැනීමට අවශ්‍ය මුදල කොපමණ ද?





..........................................

27. ගවුමක බොත්තම් කාසි 17 ක් ඇත. සෑම ගවුමකටම අමතර බොත්තමක් ද අමුණනු ලැබේ. එවැනි ගවුම් 480 කට ඇල්ලීමට අවශ්‍ය බොත්තම් ගණන කීයද?

.............................................

(ලකුණු 26)

28. කිසියම් නගරයක ස්ථාන කිහිපයක් පිහිටා ඇති ආකාරය පහත සැලැස්මෙන් දැක්වේ.




i. තැපැල් කාර්යාලයට දකුණු දිශාවෙන් පිහිටා ඇත්තේ මොනවා ද? .............................................

ii. පොලීසිය ඇත්තේ නිවසට කුමන දිශාවෙන් ද? .............................................

29. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | මිලදී ගත් ප්‍රමාණය | 1kg ක මිල රු සත | මුදල රු සත |
|---|---|---|---|
| කිරිපිටි | 2kg | 2200.00 | i. ............................ |
| සීනි | ii. ............................ | 680.00 | 510.00 |
| මුළු මුදල | | | 4910.00 |

(ලකුණු 08)

- **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. 'මම මගේ පවුලේ අයට මිණි පහනක් වන්නෙමි' යන සිතිවිල්ල ඇති වන්නේ සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ,

(1) අධිෂ්ඨානයේ දී (2) ප්‍රාර්ථනාවේ දී (3) උදානයේ දී

31. රාජ්‍ය ලාංඡනයේ කඩුවක් අතින් ගත් පලා පෙති වටය මැද සිටින සිංහයාගෙන් නිරූපණය වන්නේ,

(1) ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය

(2) රට හා විනයගරුක ජනයා

(3) සදාතන පැවැත්ම

32. මිලාද් උත්සවය සමරනු ලබන්නේ,

(1) බෞද්ධ බැතිමතුන් (2) ඉස්ලාම් බැතිමතුන් (3) හින්දු බැතිමතුන්

33. කාලගුණය පිළිබඳ ව තොරතුරු ලබා දීම හා ආර්ථික වාසි ලබා දීම යන ප්‍රයෝජන ලබා දෙන සතුන් දෙදෙනෙකු පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) මෙරුවා හා කුකුළා (2) තාරාවා හා ඇටිකුකුළා (3) වැහිලිහිණියා හා බත්කුරා

34. දැනට වාහන සඳහා භාවිත නොවන ඉන්ධන වර්ගයක් වන්නේ,

(1) ගල් අඟුරු (2) ගෑස් (3) ඩීසල්

35. 

මෙම උපකරණය මගින් කරනු ලබන කාර්යය වන්නේ,

(1) මඩ මට්ටම් කිරීම.

(2) යකඩ තලා ගැනීම.

(3) සී සෑම

36. ලී බඩු පිළිබඳ ප්‍රසිද්ධ නගරයකි.

(1) කොළඹ

(2) ගාල්ල

(3) මොරටුව

37. 

මෙම සලකුණින් නිරූපණය වන්නේ,

(1) කාන්තාවන් සඳහා වෙන් කර ඇත.

(2) ගැබිනි මව්වරුන් සඳහා වෙන් කර ඇත.

(3) කාන්තාවන්ට සිටගෙන සිටීම තහනම්

38. කුඹුරු ගොවිතැන් කටයුතුවල යෙදෙන්නන්ට සෑදෙන රෝගයකි.

(1) මී උණ

(2) කොලරාව

(3) මැලේරියාව

39. අමුත්තෙකුට උණුසුම් පානයක් පිළිගැන්වීමට සුදුසු ම භාජනය වන්නේ,

(1) දීසිය (2) වීදුරුව (3) අඩු කෝප්ප හා පීරිසිය

40. ජල රෝදය කරකැවෙන වේගය වැඩි කර ගැනීමට කළ යුතු දෙයකි.

(1) ජල පහරේ වේගය වැඩි කිරීම.

(2) තල ගණන අඩු කිරීම.

(3) ජල පහරේ උස අඩු කිරීම.

41. හුස්ම ගැනීමට සම පමණක් උපයෝගී කරගන්නා සතෙකු වන්නේ,

(1) මත්ස්‍යයා

(2) ගැඩවිලා

(3) මැඩියා


42. ගම්පහ, ගාල්ල සහ මුලතිව් යනු ශ්‍රී ලංකාවේ,


(1) පළාත් තුනකි.

(2) දිස්ත්‍රික්ක තුනකි.

(3) ගම් තුනකි.

43. සමීර සාදාගත් සිදුරු කැමරාවෙන් මිදුලේ ඇති ගසක් දෙස බැලුවේ ය. එවිට ඔහු ගස දුටු ආකාරයේ නිවැරදි රූපය වන්නේ,

(1) 

(2) 

(3) 

44. බීජ සහ අතු මගින් පැළවෙන ශාකයක් වන්නේ,
(1) නිවිති ය. (2) තක්කාලි ය. (3) පතෝල ය.

45. ශ්‍රී ලංකාවේ ආරම්භ වූ පළමු අධිවේගී මහා මාර්ගය කුමක් ද?
(1) උතුරු අධිවේගී මහා මාර්ගය
(2) කොළඹ - නුවර අධිවේගී මාර්ගය
(3) දක්ෂිණ අධිවේගී මාර්ගය

46. පාචනය රෝගය ඇති කරන්නේ,
(1) ගෙමැස්සා ය. (2) මදුරුවා ය. (3) කුරුමිණියා ය.

47. ශ්‍රී ලංකාවේ දිගම ගඟ වන්නේ,
(1) කළු ගඟ ය.
(2) මහවැලි ගඟ ය.
(3) කැලණි ගඟ ය.

48. පහත ආහාර වර්ග අතරින් ශරීරය ලෙඩ රෝගවලින් ආරක්ෂා කරන ආහාර වර්ගයකි.
(1) බත් (2) කැරට් (3) මස්

49. බතල වෙනුවට යොදා ගත හැකි ආහාරයකි.
(1) මඤ්ඤොක්කා (2) දඹල (3) බිත්තර

50. 'තෙල් ගාලා හිස පීරන් නෑනෝ - ඇට වැල අරගෙන බැඳගන් නැනෝ' මෙම කවිය කුමන වර්ගයට අයත් කවියක් ද?
(1) පැල් කවි (2) කරත්ත කවි (3) නෙළුම් කවි

51. සුළං දිශා දර්ශකයක් සෑදීමට අවශ්‍ය නොවේ.
(1) බීම බට (2) බෝතලය (3) පොරොප්පය

52. සූර්ය නමස්කාරයේ ඇති ක්‍රියාකාරකම් ගණන වන්නේ,
(1) 14 (2) 15 (3) 12

53. වැවක ජලය පිටකරනු ලබන්නේ,
(1) පිටවාන (2) සොරොව්ව (3) රළපනාව

54. 'ස්කන්ධකුමාර' ලෙස හඳුන්වන්නේ,

(1) ශිව දෙවියන්

(2) කතරගම දෙවියන්

(3) සුමන සමන් දෙවියන්

55. සාමූහික ක්‍රීඩාවලදී නොතිබිය යුතු ගුණාංගයකි.

(1) නායකත්වයට ගරු කිරීම.

(2) තම කාර්ය වගකීමෙන් ඉටු කිරීම.

(3) තමාට කැමති ලෙස හැසිරීම.

56. ලුණු කුඩු ඉක්මනින් දියවන්නේ,

(1) උණු ජලයේ ය. (2) අයිස් ජලයේ ය. (3) පොල්තෙල්වල ය.

57. හේන්වල වගාකරන බෝගයක් නොවන්නේ මින් කුමක් ද?

(1)  (2)  (3) 

58. මාර්ග ආලෝක සංඥා පුවරුවක කොළ පැහැති බල්බය දැල් වී ඇති විට එයින් හඟවනු ලබන්නේ,

(1) වාහනය නවත්වන ලෙසයි.

(2) වාහනය ධාවනය කරන ලෙසයි.

(3) වාහනය ධාවනයට සූදානම් වන ලෙසයි.

59. දිවා කාලයේ මෙන් ම රාත්‍රී කාලයේ දී ද සැරිසරන පක්ෂියෙකි.

(1) බකමූණා (2) උලමා (3) කිරලා

60. "මුහුදු වෙරළක සැන්දෑවක්" යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. (වාක්‍යයක වචන 05 ට නොඅඩු විය යුතු අතර උක්ත අඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි විය යුතු ය)

i. ........................................................................................................

........................................................................................................

ii. ........................................................................................................

........................................................................................................

iii. ........................................................................................................

........................................................................................................

(ලකුණු 6)

* * * * *